# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව
## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය
### ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි තෙවන පරීක්ෂණය (බාහිර) - 2021
2024 සැප්තැම්බර්

**මානවශාස්ත්‍ර පීඨය**

## බෞද්ධ සංස්කෘතිය

**සමයාන්තර චින්තා සහ බුද්ධදහම, ථෙරවාද හා මහායාන සම්ප්‍රදාය BUCU – E 3025**

කොටස් දෙකෙන්ම ඇතුළත් වන පරිදි ප්‍රශ්න **පහකට** (05) පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි.** **කාලය : පැය 03 යි.**

---

## I කොටස

01. සමාජ හා මානව විද්‍යාඥයින්ගේ නිර්වචන ඇසුරින් ආගම යනු කුමක්දැයි අර්ථකථනය කොට, ආගමේ කාර්යභාරය පෙන්වා දෙන්න.

02. ශුද්ධ බයිබලය හා තදනුබද්ධ පැරණි සහ නව ගිවිසුම අතර ඇති වෙනස පැහැදිලි කොට, කිතු දහමේ මූලික ඉගැන්වීම් සැකෙවින් පැහැදිලි කරන්න.

03. ඉස්ලාම් දහමේ ප්‍රභවය හා විකාශය දක්වා, එහි ප්‍රමුඛ ඉගැන්වීම් හඳුන්වා දෙන්න.

04. වාණිජ ව්‍යවසායකත්වයක් ප්‍රකට කිරීමට අදාළ ඉගැන්වීම් ඉස්ලාම් ධර්මයෙන් ගම්‍යමාන වන්නේ දැයි විමසන්න.

05. හින්දු ආගමේ ප්‍රභවයට උපස්ථම්භක වී ඇති මූලාශ්‍රය පැහැදිලි කොට, හින්දු දේව විශ්වාසයේ පරිසමාප්තිය ත්‍රිමූර්තියෙන් ප්‍රකට වන්නේදැයි විභාග කරන්න.

## II කොටස

06. මහායාන බෞද්ධ සම්ප්‍රදායේ ප්‍රභවය කෙරෙහි ඉවහල් වූ ඓතිහාසික සහ දාර්ශනික හේතු සාධක පරීක්ෂා කරන්න.

07. බෝධිසත්ත්ව යන්න හඳුන්වා දෙමින් බෝධිසත්ත්වවරයෙකු විසින් සම්පූර්ණ කළ යුතු පාරමිතා පිළිබඳව විස්තරයක් සපයන්න.

08. මහායාන වෛපුල්‍ය සූත්‍ර සැකෙවින් හඳුන්වා ඉන් දෙකක් පිළිබඳව ප්‍රමාණවත් විස්තර ඉදිරිපත් කරන්න.

09. ථෙරවාද සම්ප්‍රදායේ සුරක්ෂිතතාව පිණිස මහතෙරුන් වහන්සේලා විසින් අනුගමනය කළ සාධනීය ක්‍රියාකාරකම් ත්‍රිවිධ ධර්ම සංගායනා ඇසුරින් විභාග කරන්න.

10. පහත සඳහන් මාතෘකා අතුරින් දෙකකට (02) ප්‍රමාණවත් විවරණ සපයන්න.

    I ත්‍රිකාය සංකල්පය
    II ථෙරවාද විමුක්ති සංකල්පය
    III ක්‍රිස්තියානියේ සභා
    IV ශුද්ධ වූ අල්-කුර්-ආන්

*****************************